# 2018 නොවැම්බර් මාසය සඳහා අයැදීමට හා මැදිහත්වීමට අත්වැලක්

**"එබැවින් ඔබ ජේසු ක්‍රිස්තුස් වහන්සේ ස්වාමීන් වහන්සේ වශයෙන් පිළිගෙන තිබෙන බැවින් , ඔවුන් වහන්සේ හා ඒකාබද්ධ වී ජීවත් වන්න; ඔවුන් වහන්සේ තුළ මුල් ඇදගන්නා පරිදි ජීවත් වන්න."** ( කොලොස්සි 2:6-7)

ජේසු ක්‍රිස්තු සමිඳාණෝ කිතුනු අපගේ පමණක් නොව, මුළු මිනිස් සංහතියටම ගැළවීම උරුම කර දුන් සදාතනික විමුක්ති දායකයාණෝය. පුබුදු අපි ඔවුන් වහන්සේ අපගේ ජීවිතයේ එකම ස්වාමියාණන් ලෙස පිළිගෙන දේව රාජ්‍ය සඳහා කැපවී ජීවත් වීමට තීරණයක් ගත් පිරිසක් වෙමු. ශුද්ධවූ පාවුළු තුමා අපට පවසන පරිදි අපි ඔවුන් වහන්සේ තුළ මුල් ඇදගන්නා පරිදි ස්ථිරව සිටිය යුතුයි. එසේ සිටීමට නම් අපි ඔවුන් වහන්සේ හා ඒකාබද්ධ විය යුතුයි. එසේ නොවුනහොත් ඉන් ඇතිවන ඵල විපාකවලට මුහුන දීමට අපටම සිදු වේ.

එබැවින් අයැදීමේ සේවකයන් වශයෙන් මේ මළවුනගේ මාසය පුරාවටම කිතු දන පුබුවේ අය පමණක් නොව ප්‍රසාද ස්නාපනය හා අභිවෘද්ධි ආලේපය සක්‍රමේන්තුව ලැබූ සෑම කිතුනුවෙකුටම ඉත සිතින් මරණයෙන් උත්ථාන වූ ජේසු ක්‍රිස්තු සමිඳාණන් හා ඒකාබද්ධ ජීවත් වීමට අවැසි ශුද්ධාත්ම බලය පතා යාච්ඤා කරමු.

එසේම මේ මාසය පුරාවටම ශුද්ධික ගිනිසථානයේ දුක්විඳින ආත්මයන්ට දෙවියන් වහන්සේ වතට වතඳි දැකීමේ භාග්‍ය ලැබෙන ලෙසද යාච්ඤා කරමු.

**" ඔබ ක්‍රිස්තුස් වහන්සේ සමඟ උත්ථාන කරනු ලැබූ බැවින්,**
**දෙවියන් වහන්සේගේ දකුණු පසෙහි වැඩ හිඳින ක්‍රිස්තුස් වහන්සේ,**
**වැඩ සිටින තැන ඇති ලොව් තුරු දේ ප්‍රාර්ථනා කරන්න.**
**ලෞකික දේ කෙරෙහි නොව, ලොව් තුරු දේ කෙරෙහි සිත**
**යොමු කරන්න"** (කොලොස්සි 3:1-2 )

පළමු සතිය - දිව්‍යමය කියවීම කොලොස්සි 2:6-10 දක්වා

අයැදීමට විශේෂ යොමුව :

ජේසු ක්‍රිස්තුස් වහන්සේ හා ඒකාබද්ධ නොවී විවිධ දෙවි දේවතාවන්ගේ පිහිට පතන සියළුම කිතුනුවන් වෙනුවෙන් (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :
* ස්වාමි තාත්තා වෙනුවෙන්
* දිවැසි එකතුව සහයක එකතුව ඇතුළු පුබුදුව තුළ වගකීම් ගන්නා සියළුම දෙනා වෙනුවෙන්
* මාසයේ පළමු ඉරුදින පැවැත්වෙන සාංඝික පවුල් දිනය වෙනුවෙන්
* නොවැම්බර් 10-11 දිනවල සියළුම මූලිකත්වයක් ගන්නා අය සඳහා ප්‍රශංසාරාමයේ පැවැත්වෙන යැදුම් සම්මන්ත්‍රණය සහ වචනයේ සේවකයන් වෙනුවෙන්
* ශුද්ධිකාගිනිස්ථානයේ දුක් විඳින ආත්මයන් වෙනුවෙන්
* වෙනත් අයැදීම්

දෙවන සතිය - දිව්‍යමය කියවීම - කොලොස්සි 3:1-11 දක්වා
අයැදීමට විශේෂ යොමුව - ශුද්ධිකාගිනිස්ථානයේ ආත්මයන්ගේ ගැළවීම සඳහා
(විනාඩි 10 ක් පමණ)
වෙනත් අයැදීම්
* ප්‍රශංසාරාමයේ යාච්ඤාගනයේ ප්‍රතිසංස්කරණයට අවැසි මුදල් ප්‍රතිපාදන ලැබෙන පිණිස
* නෙවැම්බර් 17 සෙනසුරාදා ප්‍රශංසාරාමයේ පැවැත්වෙන සුමැඳි මව්වරුනගේ රැළිය වෙනුවෙන්
* පුබුදු මුද්‍රණාලයේ වැඩ කටයුතු මෙන්ම සුදතුම් ගමන බෙදා හරින, ලියන, සංස්කරණය කරන සියළුම දෙනා වෙනුවෙන්
* පුබුදු ඇසි දිසි සේවාවේ නියැලෙන සියළුම දෙනා වෙනුවෙන්
* දුරකථන, ලැප්ටොප්, කම්පියුටර් මුල්කරගෙන අන්තර්ජාලයට යොමු වි අසභ්‍ය දෙයට ඇබ්බැහි වී විනාශ වන තරුණ ළමා ජීවිත වෙනුවෙන්
* නෙවැම්බර් 17-18 දිනවල ප්‍රශංසාරාමයේ පැවැත්වෙන තරුණ සමුළුව වෙනුවෙන්
* වෙනත් අයැදීම්

තෙවන සතිය - දිව්‍යමය කියවීම - 1 ජොහාන් 4:13-21 දක්වා

අයැදීමට විශේෂ යොමුව :
ශුද්ධෝත්තම පියතුමා ඇතුළු සියළුම රදගුරු පූජක පැවිදි සියළු දෙනා සහ මුළු ශුද්ධවූ සභාව වෙනුවෙන් ( විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදිම් :
* නොවැම්බර් මස 21, 22, 23, 24, 25 දින දක්වා ප්‍රශංසාරාමයේ පැවැත්වෙන බයිබල් ඥානකාන්තියට සහභාගි වන ජනතාව සහ වචනයේ සේවකයන් වෙනුවෙන්
* වෙනත් අයැදිම්.....

හතරවන සතිය - දිව්‍යමය කියවීම - 1 ජොහාන් 1:5-10 දක්වා

අයැදිමට විශේෂ යොමුව - දේශය වෙනුවෙන් ( විනාඩි 10 ක් පමණ)

වෙනත් අයැදිම් :
* සුබැදි, සබැදි, සුරැදි, සුමැදි, සංඝයන් හා ප්‍රබෝධයේ එකතුව වෙනුවෙන්
* නොවැම්බර් මස 27-29 දක්වා ප්‍රශංසාරාමයේ පැවැත්වෙන සුරැදි සොයුරියන්ගේ ඥානකාන්තිය සහ වචනයේ සේවකයන් වෙනුවෙන්
* වෙනත් අයැදිම් ..

සැලකිය යුතුයි:
* අයැදිම් එකතුවලට සම්බන්ධ වියහැකි හැම කෙනෙක්ම ඒ ඒ මධ්‍යස්ථානවල පැවැත්වෙන මාසික එකතුවට සම්බන්ධ වන්න

* අයැදිම් එකතුවලට සම්බන්ධ අය මසකට සැරයක්වත් කණ්ඩායමක් ලෙස ශ්‍රී ප්‍රශංසාරාමයේ දිනපතා පැවැත්වෙන දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ අභිමුව අඛණ්ඩ යැදුමට සම්බන්ධ වන්න

* මාසයේ සෑම සිකුරාදාම යාච්ඤාවේ හා භාවනාවේ දිනයක් ලෙස ගත කරන්න. එදින මගේ පැය, දිව්‍ය පූජාව, ශුද්ධාත්මයාණන්ට නිරන්තර අවදිවීම, පස් වැඳැරුම් අත්දැකීම් මුල් කරගෙන නිශ්චල තාවයේ දවසක් ලෙස ගත කරන්න.

**"අයදින සියල්ලන්ට සමිදාණෝ ළංව සිටින සේක"** (ගීතාවලිය 145:18)

- අයැදීම් සේවාව -